**ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 14 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,573.10 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,852.42 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 720.68 ක් හෙවත් සියයට 28.01 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| පුනරාවර්තන | 1,272.50 | 1,239.52 | 32.98 | 2.59 |
| මූලධන | 1,300.60 | 612.90 | 687.70 | 52.88 |
| **එකතුව** | **2,573.10** | **1,852.42** | **720.68** | **28.01** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 22001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 40.00 | 33.04 | 31.00 | 36.22 | 190.00 | 77.17 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ පොදු තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 63.19 ක් විය. විස්තර පහත දැක්වේ.

| පොදු තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0013/0084/000 | 1.42 |
| 6000/0000/00/0002/0127/000 | 3.23 |
| 6000/0000/00/0016/0076/000 | 58.41 |
| 6000/0000/00/0019/0019/000 | 0.13 |
| **එකතුව** | **63.19** |

**2.4 විගණන නිරීක්ෂණය**

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1. ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 3.2 විගණන සාක්ෂි නොවීම

දෙපාර්තමේන්තුවට අදාළ මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නිම නොකළ රු.2,557,084 ක් වටිනා ගෙවීම් වවුචර් 21 ක් අස්ථානගත වී තිබුණි.

## 3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දෙපාර්තමේන්තුව වෙත 2014 වර්ෂයේදී නිකුත් කළ විගණන විමසුමකට හා සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 19 කට 2017 මැයි 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 3,058.58 ක් විය.

## 3.4 විසර්ජන ගිණුම

### අයවැය විචලනය

පර්යේෂණ සඳහා අවශ්‍ය තාක්ෂණ නිලධාරී තනතුරු 14 ක් 2013 දෙසැම්බර් 23 දින අනුමත කර ගෙන තිබුණි. නමුත් එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා රු.මිලියන 5.00 ක මූලධන ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, එම ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. ඊට අමතරව, මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීමටත්, සලසා ගෙන තිබුණු ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමටත්, කටයුතු නොකිරීම හේතුවෙන් මූලධන වැය විෂයයන් 10 ක් සඳහා රු.මිලියන 1,106.70 ක ශුද්ධ ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, ඉන් රු.මිලියන 640.43 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 54 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 22001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2016 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ණය ශේෂවල එකතුව රු.2,134,651 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 05 ක සිට වර්ෂ 10

ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ආ) නිලධාරීන් 05 දෙනෙකුට නිකුත් කර තිබුණු එකතුව රු.1,240,270 ක දේපල ණයවලට අදාළ ඇටෝර්නි බලපත්‍ර ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි.

**3.6 පොදු තැන්පත් ගිණුම්**

-----------------------

ටෙන්ඩර් තැන්පතු ගිණුමේ වූ එකතුව රු.160,000 ක තැන්පත් ශේෂ 8 ක් කල් ඉකුත් වී තිබුණත්, එම තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව 2017 අප්‍රේල් 28 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------

**3.7.1 අභ්‍යන්තර විගණනය**

-----------------------

දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණත්, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණු බැවින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3.7.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

--------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2015 හා 2016 වර්ෂවලට අදාළ කාර්යසාධන වාර්තා දෙපාර්තමේන්තුව විසින් 2017 ජුලි 14 දින වන විටත්, පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.8 වත්කම් කළමනාකරණය**

---------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 ජුලි 14 දින වන විටත් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) යක්කල ආයුර්වේද රෝහලේ නිමි හා වියළි ඖෂධ සම්බන්ධයෙන් තොග මට්ටම් හා යළි ඇණවුම් ප්‍රමාණයන් පවත්වා ගනිමින් ක්‍රමවත් තොග පාලනයක් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් රෝහලට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග 86 ක තොග ශේෂ ශුන්‍යව පැවැති බව 2016 ඔක්තෝබර් 20 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

**3.9** **බැරකම්වලට එළඹීම**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට රු.1,107,158 ක බැරකම් පවතින බව විසර්ජන ගිණුමේ වාර්තා කර තිබුණු නමුත් ඒවාට අදාළ ඉන්වොයිස් හෝ 2017 වර්ෂයේදී මුදල් ගෙවූ බව තහවුරු කෙරෙන වවුචර් හෝ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු බැවින් එම බැරකම්වල වටිනාකමේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයන් 28 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 19.63 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.10** **අනුකූල නොවීම**

**------------------**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

**---------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව සතු වාහනවලට අවසථා 08 කදී අනතුරුවලට ලක් වී රු.474,750 ක අලාභහානි සිදු වී තිබුණි. එම අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එම අලාභවලින් රු.316,650 ක් පමණක් රක්ෂණ ආවරණවලින් පියවා ගෙන තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 237 (ආ) | 2016 දෙසැම්බර් 31 දින වන විට අදාළ සැපයුම්කරුවන් විසින් සැපයීම් හා සේවා සලසා නොතිබුණත්, ගෙවීම් සහතික කරන නිලධාරියා විසින් සහතික කළ ගෙවීම් වවුචර් සඳහා මුදල් රෙගුලාසි 237 ට පටහැනිව රු.මිලියන 33.66 ක් වටිනා චෙක්පත් 9 කට අත්සන් කර ගිණුම්ගත කර තිබුණි. එම චෙක්පත් අදාළ සැපයුම්කරුවන් වෙත භාර නොදී අත රඳවා ගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1 හා 22 වගන්ති | සමහර සේවකයින් සිරිතක් වශයෙන් වර්ෂයට හිමි නිවාඩු ප්‍රමාණය ඉක්මවා නිවාඩු ලබා ගෙන තිබුණු අතර ඉන් කිහිප දෙනෙකු ලබා ගෙන තිබුණු නිවාඩු ප්‍රමාණය දින 90 ක සිට දින 217 ක් අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. වැටුප් රහිත නිවාඩු ලබාගන්නා මාසයේ සිට එළඹෙන ඊළග මාසයේ සිට වැටුප් රහිත නිවාඩු ගණනට අදාල වැටුපේ වටිනාකම, වැටුපෙන් අය කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව එ අනුව කටයුතු කර නොතිබුණි. |

**3.11 දේශීය මූල්‍යකරණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**-----------------------------------------------------------**

ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) ඩෙංගු, කොලොස්ටරෝල්, දියවැඩියාව, පිළිකා, වකුගඩු රෝග යනාදී බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර කළමනාකරණය කිරීමේ පද්ධතිය පිළිබද පර්යේෂණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය විසින් 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළදී දේශීය අරමුදල්වලින් එකතුව රු.මිලියන 892.00 ක ප්‍රතිපාදන ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 440.93 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** ව්‍යාපෘතිය සඳහා 2013 දෙසැම්බර් 23 දින සිට අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 269 ක් වුවද, එම කාර්ය මණ්ඩලය තුළ අත්‍යාවශ්‍ය තනතුරු වූ විද්‍යාඥ තනතුරු 02 ක්, විද්‍යාත්මක නිලධාරී තනතුරු 06 ක්, පර්යේෂණ නිලධාරී තනතුරු 18 ක්, වෛද්‍ය පර්යේෂණ ශිල්පී තනතුරු 03 ක් සහ විශේෂඥ වෛද්‍ය නිලධාරී අනුමත තනතුරු 3 ක්, පර්යේෂණ සහකාර අනුමත තනතුරු 07 ක් හා තාක්ෂණ නිලධාරී තනතුරු 12 ක් ඇතුළුව තනතුරු 129 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුවී පැවතුණි.

**(ii)** 2013, 2014 හා 2015 වර්ෂවලදී රු.මිලියන 164.97 ක් හා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 38.05 ක් වටිනා පර්යේෂණ උපකරණ මිලදී ගෙන තිබුණි. අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පුරවා නොතිබීම හේතුවෙන් 2017 ජනවාරි 24 දින වන විටත් රු.මිලියන 103.12 ක් වටිනා උපකරණ භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. තවද, අවශ්‍ය රසායන ද්‍රව්‍ය මිලදී නොගැනීම හේතුවෙන් රු.මිලියන 1.91 ක්වූ උපකරණයක් පාවිච්චි කළ නොහැකිව පැවැතුණි.

(ආ) පාරම්පරික දැනුම සංරක්ෂණය හා දේශීය වෙදකම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිවයින පුරා සිටින සෑම පාරම්පරික වෛද්‍යවරයෙකුම සතු දැනුම සංරක්ෂණය කිරීමට හා ඒ සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය තොරතුරු විශ්ව කේන්ද්‍රයක් ස්ථාපිත කිරීමට බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය විසින් ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘතියක් 2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. ඒ සඳහා රු.මිලියන 27.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ඒකකය ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 12.00 ක් පමණක් ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.මිලියන 23.56 ක් වැයකර එම ඒකකයට අවශ්‍ය උපකරණ මිලදී ගෙන තිබුණි. එම ඒකකයේ කටයුතු කරගෙන යාමට සෘජුවම අවශ්‍යවන ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයභාර නිලධාරි, වැඩ සටහන් නිෂ්පාදක, තාක්ෂණ නිලධාරී, වීඩියෝ සංස්කාරක, ශබ්ද සංස්කාරක හා සහායක, පරිගණක ක්‍රියාකරු යන තනතුරු 07 ක් සහ කැමරා ශිල්පී තනතුරු 03 ක් අනුමත කර ගෙන තිබුණි. ඒ සඳහා බඳවා ගැනීම් සිදු කර නොතිබුණු බැවින් අදාළ උපකරණ භාවිතා කර නොතිබුණි.

**(ii)** පාරම්පරික දැනුම සංරක්ෂණය සඳහා පාරම්පරික වෛද්‍යවරුන් පිළිබඳ තොරතුරු ලබාගැනීම, පාරම්පරික දැනුම සංරක්ෂණය, ගුරුකුල මගින් පාරම්පරික දැනුම ඉදිරියට ගෙනයාම, පාරම්පරික දැනුම පිළිබඳ බුද්ධිමය දේපල අයිතිය තහවුරු කිරීම හා බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණාගාරයේ ඇති පැරණි පොත් සංරක්ෂණය කිරීම යන ක්‍රියාකාරකම් සඳහා සලසා තිබුණු රු.මිලියන 15.00 ක ප්‍රතිපාදන ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ඒකකයේ උපකරණ මිලදී ගැනීමට වැයකර තිබුණි.

**(iii)** ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය ලෙස වෘත්තිය මට්ටමේ ඡායාරූපාගාරයක් ඉදිකර තිබුණු අතර ඒ සඳහා දැනුම හා පුහුණුව නැති ආයුර්වේද වෛද්‍යවරයෙකු එම ඒකකයට අනුයුක්ත කර තිබුණි. ඒ හේතුවෙන් ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයෙන් අපේක්ෂිත කාර්යයන් ඉටු කර නොතිබුණු අතර ආයුර්වේද වෛද්‍යවරයෙකු වශයෙන් ඔහුගෙන් ලබා ගත යුතු සේවයද දෙපාර්තමේන්තුවට අහිමි කර තිබුණි.

**(iv)** ව්‍යාපෘතියේ මූලික අරමුණ වූ පාරම්පරික දැනුම සංරක්ෂණය හා දේශීය වෙදකම ප්‍රවර්ධනය කිරීමට අදාළව සැලැසුම් කර තිබුණු වෛද්‍ය ග්‍රන්ථ, වෛද්‍ය උපකරණ, වෙනත් වෛද්‍ය තොරතුරු සංරක්ෂණය කිරීම, පරම්පරා 10 ක පාරම්පරික ශිෂ්‍යයන් පුහුණු කිරීම, දේශීය පාරම්පරික දැනුම පිළිබඳ බුද්ධිමය දේපල අයිතිය තහවුරු කිරීම, සංරක්ෂණය කරන ලද පොත් 100 ක පිටපත් හා වාර්ෂික සඟරා එළිදැක්වීම හා පාරම්පරික දැනුම සංරක්ෂණය කිරීමේ විශ්ව කේන්ද්‍රය පිහිටුවීම යන කාර්යයන් ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**(ඈ)** දේශීය වෛද්‍ය ක්‍රමය වර්තමානයට මෙන්ම අනාගත පරපුරේ රෝග නිවාරණය සඳහා භාවිතා කළ හැකි ක්‍රමයක් වන බැවින් එහි සංවර්ධනය හා සංරක්ෂණය සඳහා පියවර ගැනීමේ කාලීන අවශ්‍යතාවයක් විය. ඊට පිළියමක් ලෙස සහ දේශීය වෙදකම පිළිබඳ හදාරණ දේශීය හා විදේශීය සිසුන්ටද, දේශීය වෙදකම පිළිබඳ පර්යේෂණවල යෙදෙන පර්යේෂකයින්ටද මහඟු අවස්ථාවක් සැලසීමේ අරමුණින් මෛත්‍රිපාල සේනානායක අනුස්මරණ පාරම්පරික පර්යේෂණ රෝහල හා කෞතුකාගාරය මිහින්තලේ ඉලුප්පුකන්නි ප්‍රදේශයේ ඉදිකිරීම සඳහා 2008 ජූලි 18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමස්ථ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 586.70 ක් වූ අතර අදියර 04 කින් නිමකිරීමට සැලැසුම් කර තිබුණි. ඒ අනුව ඉදිකිරීම ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවට පවරා දීමටද, පළමු අදියරය දින 630 ක් තුළදී රු.මිලියන 31.30 ක පිරිවැයකට ඉදිකිරීමටද, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. නමුත් පළමු අදියර රු.මිලියන 39.95 කට ඉදිකර අවසන් කිරීමට 2012 නොවැම්බර් 26 දින ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. නමුත් පළමු අදියර රු.මිලියන 8.65 කින් කොන්ත්‍රාත්තුවේ

වටිනාකම වැඩිකර ගිවිසුම්වලට එළඹ තිබුණත්, ඒ සඳහා අධිකාර බලය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියට අදාළව ගෙවීම් සඳහා ඉදිරිපත් කළ සමස්ත බිල්පත් වටිනාකම රු.මිලියන 29.42 ක් වූ අතර 2015, 2016 හා 2017 වර්ෂ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා ඉන් 2014 වර්ෂයට අදාළ රු.මිලියන 2.84 ක බිල්පතක් හා 2016 වර්ෂයට අදාළ රු.මිලියන 4.83 ක් වශයෙන් වූ බිල්පත් දෙකකට 2017 මාර්තු 30 දින වන විටත් මුදල් ගෙවා නොතිබුණි.

(iii) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2008 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු අතර, 2012 දෙසැම්බර් මාසයේදී එහි වැඩ ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ ඉතිරි අදියර 03 හි වැඩ ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කර නොතිබීම නිසා ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නොහැකිවී තිබුණි.

(iv) පළමු අදියර යටතේ ඉදිකර තිබුණු ගොඩනැගිල්ල දෙපාර්තමේන්තුව වෙත 2017 මාර්තු 31 දින භාරදී තිබුණි. එම ගොඩනැගිල්ල පිළිබඳව 2017 ජූලි 12 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- දොරවල් අගුළු ලා තිබීම හේතුවෙන් ඇතුළත පරීක්ෂා කිරීමට නොහැකි වූ අතර ඉංජිනේරු සංස්ථාවේ වැඩබිම් ඒකක ගලවා ඉවත් නොකිරීම හේතුවෙන් වැඩබිම තුළ ගබඩා දෙකක් පැවැතුණි.
- භාරදීමෙන් පසු 2017 ජූලි 14 දින වන විටත් භාවිතයට නොගැනීම හේතුවෙන් ගොඩනැගිල්ල අවට වල් බිහිවී තිබුණි. ජනෙල් සඳහා ග්‍රිල් සවිකර නොතිබුණු අතර විනිවිද පෙනෙන වීදුරු සහිත ජනෙල් පියන් සවිකර තිබීම හේතුවෙන් එහි ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් මතුවී තිබුණි.
- ජල සම්බන්ධතාවය සහ විදුලි සම්බන්ධතාවය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.
- වහලය වටා ගසා ඇති වඩිම්බු පටි ස්ථාන කිහිපයකින් ගැලවීගොස් තිබුණු අතර, අත්තිවාරමේ ඉහළ කොටසේ බැම්ම ස්ථාන කිහිපයකින් ඉරිතලා තිබුණි.
- බිත්තිය සහ වහලය අතර විශාල ප්‍රමාණයේ හිඩසක් සහිතව ඉදිකිරීම් කටයුතු සිදුකර තිබීම නිසා පරීක්ෂා කරන අවස්ථාව වන විටත් පරවියන් ලැගුම්ගන්නා ස්ථානයක් බවට පත්ව තිබුණි. ජනෙල් රාමුවේ පියනට ඉහල කොටස (අඩි 2 1/2) තුළ ලී පටි සහිත බීරළු සවිකර තිබුණද බීරළු දෙකක් අතර පරතරය විශාල හෙයින් විවිධ සතුන්ට ගොඩනැගිල්ල තුළට පැමිණීමේ වැඩි හැකියාවක් පැවතුණි.

**(ඇ)** 2014 වර්ෂය මැද භාගයේ දිස්ත්‍රික්ක ගණනාවක පැතිර පවතින වකුගඩු රෝගය මුලිනුපුටා දැමීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යාව තුළින් ගතහැකි දායකත්වය ඉහළ නැංවීම අරමුණු කරගෙන ඇඳන් 50 කින් යුක්ත රෝහලක් මැදවච්චියේ ඉදිකිරීමට තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉංජිනේරු ඇස්තමේන්තුව රු.53,836,395 ක් වූ අතර මෙය කාලීන අවශ්‍යතාවයක් ලෙස සලකා 2014 වර්ෂයේදීම ඉදිකර අවසන් කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රාජ්‍ය අරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. නමුත්

ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධානවලට අනුකූල නොවන ලෙස, සමස්ත ඉංජිනේරු ඇස්තමේන්තුවට සමාන මුදලක් ව්‍යාපෘතිය ආරම්භයේදීම යුධහමුදා මූලස්ථානයට ගෙවා තිබුණි.

(iii) 2012 අගෝස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් අනුමැතිය ලබානොගෙන ස්ථානීය වෙනස්කම් හා අත්‍යාවශ්‍ය නව ඉදිකිරීම් කොටස් හේතුවෙන් ඇස්තමේන්තුව රු.මිලියන 85.37 ක් දක්වා සංශෝධනය කර 2015 දෙසැම්බර් 31 දින සංශෝධිත ඇස්තමේන්තුවට අනුව ගෙවිය යුතු ඉතිරි රු.මිලියන 31.54 ක් යුධ හමුදාව වෙත ගෙවා තිබුණි.

(iv) මෙම කොන්ත්‍රාත් කාර්යයට අදාළව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව දෙපාර්තමේන්තුව අතර ගිවිසුමකට එළැඹීමට හෝ අත්තිකාරම් සුරක්ෂණයක් හා කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට හෝ රැඳවුම් මුදල් අඩුකර ගැනීමට හෝ අදාළ ගෙවීම් කිරීමට පෙර කරන ලද වැඩ කොටස් ඇගැයීමට ලක් කිරීමට හෝ අවසන් කළ වැඩ පිළිබඳව ඉංජිනේරු සහතිකයක් ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(v) 2015 දෙසැම්බර් 31 දින වනවිට සමස්ත සංශෝධිත කොන්ත්‍රාත් පිරිවැය වූ රු.මිලියන 85.37 ක් ගෙවා අවසන් කර තිබුණද, 2017 ජූනි 30 දින වන විටත් මෙම රෝහල ඉදිකර අවසන් කර දෙපාර්තමේන්තුව වෙත භාර දී නොතිබුණි.

(vi) රෝහල පිළිබඳව 2017 ජූලි 12 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- වෛද්‍ය නිල නිවාස කාමර 04 ක් සහ හෙද නිල නිවාස කාමර 04 ක පොළව ටයිල් කිරීම සිදුකර නොතිබුණු අතර ඒවායේ ජනෙල්, දොරවල්, ෆෑන්, ලයිට් සහ විදුලි ජේනුද සවිකර නොතිබුණි.

- තාප්පයේ අඩි 800 ක ප්‍රමාණයක් ඉදිකර නොතිබුණු අතර ඉදිකළ තාප්පයේද කොටසක් කපරාරු කර නොතිබුණි.

- දිග අඩි 13 ක් සහිත ගේට්ටු 03 ක්, දිග අඩි 05 ක ගේට්ටුවක් හා දිග අඩි 590 ක කාණු පද්ධතිය ඉදිකර නොතිබුණි.

## 3.12 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.මිලියන 34.73 ක් වූ කාර්යයන් 23 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර හෝ නොතිබුණි. මුළු ප්‍රතිපාදනය රු.මිලියන 1,028.60 ක් වූ කාර්යයන් 17 ක් වර්ෂය අවසාන වන විට අවසන් කර ගැනීමට අපොහොසත්වී තිබුණි. එසේ වුවද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණු කාර්යයන් 26 ක් රු.මිලියන 14.96 ක් වැයකර ඉටුකර තිබුණි. ඒ අනුව අරමුණු ඉටුකර ගැනීමට පාලන කාරකයක් ලෙස ක්‍රියාකාරී සැලැස්ම උපයෝගී කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.13 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්

---------------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2014 වර්ෂයේදී රු.මිලියන 148.20 ක් වැයකර බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයට පරීක්ෂණ උපකරණ මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 මාර්ගෝපදේශය ප්‍රකාරව, විශාල හා කුඩා කොන්ත්‍රාත්කරුවන්ට සහභාගීවීමට හැකි වන පරිදි විශාල කොන්ත්‍රාත් කුඩා කොටස්වලට බෙදා ගොනු හෙවත් පැකේජ් ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය කළ හැකි වුවත්, ඊට අනුකූල නොවන පරිදි මිලදී ගැනීමට අපේක්ෂිත උපකරණ 53 ක් එක් ගොනුවක් ලෙස සලකා එම සමස්ත ගොනුවට පමණක් ලංසු කැඳවා තිබුණි. එසේ ලංසු ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම මත එම ලංසුව සලකා බැලීම ප්‍රතික්ෂේප කරන බව කොන්දේසියක් සහිතව ප්‍රසම්පාදන දැන්වීම පළකර තිබුණි. සැපයුම්කරුවන් 02 දෙනෙකු පමණක් උපකරණ 53 ක පැකේජය සඳහා ලංසු ඉදිරිපත් කර තිබුණු අතර, උපකරණ 53 කින් උපකරණ කිහිපයකට පමණක් ලංසු ඉදිරිපත්කර තිබුණු සැපයුම්කරුවන් 06 දෙනෙකුගෙන් සැපයුම්කරුවන් 04 දෙනෙකුගේ ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි. උපකරණ 53 ක පැකේජය සඳහා ලංසු ඉදිරිපත් කරන ලෙස දැන්වීම් පළ කර තිබුණද, එකිනෙක උපකරණය සඳහා වෙන වෙනම තාක්ෂණික ඇගැයීම් සිදුකර තිබුණි. උපකරණ 53 ක් සඳහා වෙන වෙනම ලංසු කැඳවූයේ නම් මීට වඩා වැඩි ලංසු ප්‍රමාණයක් ලැබීමට තිබුණු හැකියාව හා හොඳම භාණ්ඩය, හොඳම සැපයුම්කරු මගින් ලබාගැනීමේ හැකියාව බැහැර වී තිබුණු බව නිරීක්ෂණය විය. එකිනෙක උපකරණය සඳහා වෙන වෙනම තාක්ෂණික ඇගැයීම් සිදුකර තිබුණු නමුත් උපකරණ 53 ම එක් සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගෙන තිබුණු අතර උපකරණ 53 කින් උපකරණ 10 ක තාක්ෂණික ඇගැයීම් පිළිබඳව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී උපකරණ 05 ක් සම්බන්ධයෙන් අවශ්‍යතා පිරිවිතර සම්පූර්ණවී නොතිබියදී මිලදීගෙන තිබුණු බව අනාවරණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 23.56 ක් වැයකර බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයට ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ මිලදී ගෙන තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සැපයීම, සවි කිරීම, පරීක්ෂා කිරීම, පුහුණු කිරීම හා නඩත්තු කිරීම සඳහා ලංසු කැඳවීම යන මැයෙන් පුවත්පත් දැන්වීම් පළ කර තිබුණද, ප්‍රසම්පාදන ලියවිලි කට්ටලය මගින් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හැරුණුවිට ආරක්ෂක පද්ධති, සෝෆා කට්ටල, පොත් රාක්ක, ලිපිගොනු කැබිනට්, පරිගණක මේස, විධායක පුටු, කාර්යාලීය පුටු යනාදිය මිලදී ගැනීමටත් ලංසු කැඳවා තිබුණි. ඒ අනුව ලංසු කැඳවීමේ දැන්වීමෙන් ප්‍රසිද්ධ නොකළ කාර්යාල උපකරණ හා ලී බඩු මිලදී ගැනීමට ප්‍රසම්පාදන ලියවිලි පිළියෙල කර තිබීමෙන් කාර්යාල උපකරණ හා ලී බඩු සඳහා තරගකාරී ලංසු ඉදිරිපත්වීම සීමා කර තිබුණි.

**(ii)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව තරගකාරී ලංසු ඉදිරිපත් කිරීමට දින 21 ක කාලයක් ලබාදිය යුතු වුවත්, ඒ සඳහා දින 18 ක කාලයක් පමණක් ලබාදී තිබුණි.

**(iii)** පත් කළ තාක්ෂණික ඇගැයීම් කමිටුව අවස්ථා 03 කදී වෙනස්කර තිබුණු නමුත් ඊට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

**(iv)** අයිතම 25 කට අදාළ තාක්ෂණික පිරිවිතර පිළියෙල කර තිබුණු නමුත් තාක්ෂණික ඇගැයීම් කමිටු විසින් එකිනෙක පිරිවිතර වෙන වෙනම ඇගැයීම් කළ බව තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි පවත්වා නොතිබුණි.

**(v)** ප්‍රතික්ෂේපිත එක් ආයතනයක් විසින් ප්‍රධාන උපකරණ 03 කට ලංසු ඉදිරිපත් කර තිබුණු නමුත්, එම ආයතනය ලංසු ඉදිරිපත් නොකළ ආයතනයක් ලෙස තාක්ෂණික ඇගැයීම් කමිටු වාර්තාවේ දක්වා තිබුණු අතර එය ඇගැයීමට භාජනය කර නොතිබුණි.

**(vi)** වීඩියෝ කැමරාව, ඊට අවශ්‍ය බැටරි සහ කියවීම් සඳහා රු.950,000 ක ලංසුවක් ඉදිරිපත්වී තිබියදී ඒ පිළිබඳව නොසලකා රු.2,500,000 ක් ගෙවා වීඩියෝ කැමරාවක් සහ රු.1,836,000 ක් ගෙවා ඊට අවශ්‍ය බැටරි සහ කියවීම් මිලදී ගෙන තිබුණි.

(ඇ) බොරැල්ල ආයුර්වේද රෝහල ඉදිකිරීමේ දෙවන අදියරට අදාළ කොන්ත්‍රාත්තුවේ, කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 1,113.16 ක් වූ අතර 2017 පෙබරවාරි 17 දින වන විට කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු එකතු කළ අගය මත බදු රහිත මුළු මුදල රු.මිලියන 798.65 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** කොන්ත්‍රාත්තුවේ උපදේශක වූ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව, ඉටුකරන ලද වැඩ මිනුම් කර ගෙවීම් සහතික කළයුතු වුවද, අංක 19 දරන අතුරු ගෙවීම් සහතිකය සඳහා ඉටුකරන ලද වැඩ මිනුම් නොකර ගෙවීම් සහතික කර තිබුණු අතර ඒ පිළිබඳව නොසලකා එම ගෙවීම් සහතිකය පදනම් කර ගනිමින් දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 29.47 ක් 2017 පෙබරවාරි 17 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

**(ii)** 2016 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු විචලතා පිළිබඳ වාර්තා 16 ක් පදනම් කර ගෙන රු.මිලියන 47.52 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එම විචලතා නියෝග 16 තුළ පැවති අතිරේක වැඩ අයිතම 30 ක් සඳහා විශේෂ ගෙවීම් රේටයන් වෙළඳපල මිල ගණන් උපයෝගී කර ගෙන උපදේශක ආයතනය විසින් පිළියෙල කර කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය හා ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබා ගෙන ගෙවීම් කළ යුතු වුවත්, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු රේටයන් පදනම් කර ගෙන ගෙවීම් කර තිබුණු අතර සමහර රේටයන් පමණක් සංශෝධනය කර තිබුණි. එම සංශෝධනයන් සිදුකළ පදනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව අතිරේක වැඩ සඳහා ගෙවා තිබුණු මුළු මුදල රු.මිලියන 41.14 ක් විය.

**(iii)** කොන්ත්‍රාත්කරු සමඟ එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව, දින 540 කින් ඉදිකිරීම් කටයුතු නිම කළ යුතු බැවින් හා 2015 මැයි 05 දින වැඩ ආරම්භ කර තිබුණු බැවින් 2016 ඔක්තෝබර් 26 දින වන විට වැඩ අවසන් කළ යුතුව තිබුණි. නමුත් 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු ප්‍රගති වාර්තා අනුව මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 743.27 ක් හා භෞතික ප්‍රගතිය සියයට 63 ක් පමණක් වී තිබුණි.

**(iv)** ව්‍යාපෘති කාලය දින 67 කින් දීර්ඝ කර තිබුණු නමුත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රමාදයන් සිදුවූයේ කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර වූ අවස්ථානුගත හේතූන් අනුවද යන්න තහවුරු කර ගෙන නොතිබුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර, කොන්ත්‍රාත්තුවේ වියදම සපුරාලීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන තිබෙන බවට ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සහතික විය යුතු වුවත්, දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා නොගෙන බොරැල්ල ආයුර්වේද රෝහල ඉදිකිරීමේ දෙවන අදියරට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ හේතුව නිසා 2016 දෙසැම්බර් 31 වන විට කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට සිදුවී තිබුණු ප්‍රමාද ගාස්තු රු.මිලියන 16.79 ක් වී තිබුණි.

(vi) ප්‍රමාණ පත්‍රයේ (BOQ) මුල් අයිතමයන් වූ, පවතින ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම හා Dynamic Testing of Piles යන අයිතම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් මිල රේටයන්ට වඩා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු මිල රේටයන් සියයට 786.86 ක සිට සියයට 1559.9 ක දක්වා වූ පරාසයක ප්‍රමාණවලින් වැඩිවී තිබුණි. නමුත් ඒ පිළිබඳව තාක්ෂණ ඇගැයීම් කමිටුව විසින් සලකා බලා නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර එම මිල රේටයන් අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vii) ගොඩනැගිල්ලේ පල්දෝරු පද්ධතිය ඉදිකිරීම සැලැසුම් පිළියෙල කිරීමේදී නොසලකා හැර තිබුණු අතර, ඉංජිනේරු ඇස්තමේන්තුවට ඇතුළත් කරද නොතිබුණි. ඒ අනුව ඉදිකිරීම් අවසන් වූ පසු පල්දෝරු පද්ධතිය ඉදිකිරීමේදී නොයෙකුත් ප්‍රායෝගික ගැටළු මතු විය හැකි බවද නිරීක්ෂණය විය.

(ඇ) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ විද්‍යාගාරය නවීකරණය හා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 47.53 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දින වන විට මුළු කොන්ත්‍රාත් වටිනාකම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු වටිනාකම රු.මිලියන 62.45 ක් වූ නමුත් රු.මිලියන 14.92 ක් වූ අභ්‍යන්තර දුරකථන පද්ධතිය, පරිගණක අන්තර්ජාල පද්ධතිය හා ගෑස් පද්ධතිය යන අයිතම ඉවත්කර රු.මිලියන 47.53 ක් දක්වා ලංසු වටිනාකම අඩුකර කොන්ත්‍රාත්තුව පිරිනැමීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. එසේ අඩු කළ අයිතමයන්ගේ වටිනාකම් වෙන් වෙන්ව සඳහන් කර නොතිබුණු අතර එම අයිතම අඩු කිරීමට හේතුව ලෙස එම පද්ධතීන් සාමාන්‍ය ආකාරයෙන් කරගැනීම වාසිදායක බව සඳහන්කර තිබුණද, විගණිත දිනය වූ 2017 ජුනි 29 දින වන විටත් එම පද්ධති විද්‍යාගාරය තුළ ස්ථාපිත කර නොතිබුණි.

## 3.14 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2014 | 4.15(අ) | 2012 ජුලි 13 දින දෙපාර්තමේන්තුවෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙත ස්ථානමාරුවී ගිය වෛද්‍යවරයෙකුට එතැන් සිට මාස 15 ක් සඳහා රු. 548,376 ක වැටුප් ගෙවා තිබුණි. ඉන් රු.200,000 ක් ආපසු අය කර ගෙන තිබුණු නමුත් ඉතිරි රු. 348,376 ක් සහ රජයේ ගාස්තු රු.137,094 ක් ඇතුළත් මුළු මුදල රු. 485,470 ක් අයකර ගෙන නොතිබුණි. |
| 2015 | 3.11 | දෙපාර්තමේන්තුවේ ලොරි රථය 2014 ජුනි 03 දින සිට ජුනි 27 දින දක්වා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණු නමුත් ඒ වෙනුවෙන් අයකර ගත යුතු කුලිය රු. 102,261 ක් විගණිත දිනය වූ 2016 ජුනි 17 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. |

## 3.15 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය වෙනුවෙන් ඔසු උයන්වල නිෂ්පාදනය කළ යුතු පැල වර්ග හා ප්‍රමාණය පිළිබඳ ඉලක්කයන් ලබාදී නොතිබුණි. ඒ හේතුවෙන් 2016 වර්ෂය තුළ රෝපනය කළ යුතු පැල වර්ග හා ප්‍රමාණය ඔසු උයන් භාර ස්ථානභාර නිලධාරීන්ගේ අභිමතය පරිදි සිදුකර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ඔසු උයන් 06 ක පැල තවාන්වලින් මුළු වටිනාකම රු.මිලියන 2.46 ක් වූ ඔසු පැල 62,774 ක් විධිමත් අනුමැතියකින් තොරව නොමිලේ බෙදා හැර තිබුණි. නොමිලේ පැල අයදුම් කරන ලද බව හෝ පැල ලබා දුන්නේ කාටද යන්න පිළිබඳව හෝ තහවුරු කර ගැනීමට කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි.

## 3.16 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගයෙ | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 555 | 527 | 28 |
| (ii) | තෘතීයික මට්ටම | 195 | 113 | 82 |
| (iii) | ද්විතීයික මට්ටම | 291 | 158 | 133 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 929 | 643 | 286 |
| | **එකතුව** | **1,970** | **1,441** | **529** |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i)** විධිමත් ස්ථාන මාරු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර වර්ෂ 10 කට ආසන්න කාලයක සිට ස්ථාන මාරුවීම් ලබා නොගෙන එකම සේවා ස්ථානයක සේවය කරන නිලධාරීන් 435 ක් සිටින බව තහවුරු විය. ඉන් සමහර නිලධාරීන් මුල් පත්වීම් දිනයේ සිට එකම සේවා ස්ථානයක සේවය කරන බවද තහවුරු විය.

**(ii)** 2016 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ඇති රෝහල් 07 ක් පිළිබඳව ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව, රෝහලක් පවත්වා ගෙනයාමට අත්‍යාවශ්‍ය තනතුරු සමහර රෝහල්වලට අනුමත වී නොතිබුණු බවත්, සමහර රෝහල්වල විශාල ප්‍රමාණයක පුරප්පාඩු පැවතියද එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.